අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும்
அரசியலமைப்பு மறுசீரமைப்பு

Ministry of Justice, Prison Affairs and
Constitutional Reforms

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - අංක 290

அரசாங்க கணக்குகள் பற்றிய குழுவின் பாராளுமன்ற வெளியீட்டுத் தொடர் – இல. 290

Series of Parliamentary Publications of the Committee of Public Accounts - No. 290

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்றத்தின் அரசாங்க கணக்குகள் பற்றிய குழுவினால் சபாபீடத்தில் வைக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளை பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports Tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119 (4)

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුවේ නම	ශීර්ෂය
01. අධිකරණ අමාත්‍යාංශය	110
02. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශය	418
03. අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව	228
04. ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	234
05. ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව	231
06. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	233
07. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව	230
08. නීතිපති දෙපාර්තමේන්තුව	229
09. නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව	235
10. බන්ධනාගාර දෙපාර්තමේන්තුව	332
11. ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	326

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : අධිකරණ අමාත්‍යාංශය -110
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස : 58.00	
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව කර පවත්වාගෙන යනු ලබයි.
පුද්ගල පඩි නඩි ලේඛණය/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	පුද්ගල පඩි නඩි ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි. එහි දී සෑම මසකම 20 වන දිනට ප්‍රථම පුද්ගල පඩි ලේඛණය යාවත්කාලීන කර අවසන් කරනු ලබයි.
විගණන විමසුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	විගණන විමසුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
සිගාස් පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කර මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව නිකුත් කළ මාර්ගෝපදේශවල නියමිත දිනයට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අනුව මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට පෙර ඉදිරිපත් කරනු ලබයි.
ලැබෙන වෙකපත් සහ මුදල් ඇනවුම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ලැබෙන වෙක්පත් සහ මුදල් ඇනවුම් ලේඛණය සරප් විසින් යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලබයි.
බඩු වට්ටෝරු ලේඛණය යාවත්කාලීන පවත්වා නෙතිබුණි.	මේ වන විට බඩු වට්ටෝරු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
පාරිභෝගික ද්‍රව්‍ය ලේඛණය යාවත්කාලීන පවත්වා නෙතිබුණි.	මේ වන විට පාරිභෝගික ද්‍රව්‍ය ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීන පවත්වා නෙතිබුණි.	මේ වන විට හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.
මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීම 2021.01.13 දින සිදු කර ඇත. 2021 මුදල් වර්ෂය සඳහා මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතියෙහි පළමු කොටසෙහි මූල්‍ය බලතල පැවරීම යටතේ පිටු අංක 06 හි මූල්‍ය බලතල පැවරීම සිදු කර ඇති බව පැහැදිලිව සඳහන් කර ඇත.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම 2015.09.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් නිකුත් කළ MNPEA/AAG/15 දරණ මාර්ගෝපදේශයේ උපදෙස් අනුව සකස් කර ඇත. 2022, 2023, සහ 2024 ක්‍රියාකාරී සැලසුම් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 20/2020 අනුව සකස් කර ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2023 වර්ෂයේ දී විගණන විමසුම් 20ක් ලැබී ඇති අතර විගණන විමසුම් 15ක් සඳහා මාසයක් ඇතළත පිළිතුරු ලබා දී ඇති අතර, ඉතිරි විගණන විමසුම් 05 සඳහා මාස 2ක් ඇතුළත පිළිතුරු ලබා දී ඇත. ඉදිරියේ දී විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන විගණන විමසුම් සඳහා

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

	මාසයක් ඇතුළත පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ඉදිරියේ දී ප්‍රමාදයකින් තොරව පිළිතුරු යැවීමට කටයුතු කරනු ලැබේ.
2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුලත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍යාංශයේ භාණ්ඩ සමීක්ෂණය 2020 වර්ෂයේ ප්‍රමාද වුව ද ඉදිරි වර්ෂයන් හි නියමිත කාලය තුල භාණ්ඩ සමීක්ෂණය හා වෙන්දේසිය සිදු කර අවසන් කිරීමට සැලසුම් කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා මේ වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	සියලු වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කරනු ලැබේ.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයට සලසා ඇති ප්‍රතිපාදන සීමාව තුළ පමණක් බැඳීම් ඇති කර ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	**මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ** • එල්.පී.සී.පී.සිරිවර්ධන - රු.250,838.00ක මුදල අය කර ගෙන ඇත • එච්.ආර්.එන්.එම්.අයි.නියංගොඩ - රු.220,103. 00ක මුදල අය කර ගෙන ඇත. • ආර්.එම්.වී.විශ්වජිත් - රු.189,177. 00ක හිඟ ණය මුදල අය කර ගැනීම සඳහා අදාල නිලධාරියාගේ මරණ පාරිතෝෂිකය සඳහා අවශ්‍ය ලිපි සැකසෙමින් පවතින අතර මරණ පාරිතෝෂිකය ගෙවීම සඳහා යැපෙන්නන්ගේ වාර්තාව ප්‍රාදේශීය ලේකම්ගෙන් සහතික කර ගැනීමට යොමු කර ඇති හෙයින් මරණ පාරිතෝෂිකය සකස් කිරීමට නොහැකි වී ඇත. **විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ** • එන්.පී.ගාල්ලගේ - රු.350,979.00ක මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කර ගෙන ඇත. • පී.බී.තෙන්නකෝන් - රු.17,789. 00ක මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කර ගෙන ඇත. **වැඩ තහනම් කල නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ** • එම්.අයි.ප්‍රනාන්දු - රු.49,150.00 අදාල පුද්ගලයාට ලියාපදිංචි තැපැල් මඟින් දැනුම් දී ඉන් අනතුරුව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මඟින් දැනුම් දී ඇත. කෙසේ නමුත් ණය ශේෂය පියවා නොමැති අතර ඒ අනුව ණය අයකර ගැනීම සඳහා කෙසෙල්වත්ත පොලිසියේ

	පැමිණිල්ලක් දමා ඇති අතර මේ වන තෙක් පැමිණිල්ල කැඳවා නැත.එබැවින් නැවත සිහි කැඳවීම් ලිපි යොමු කර ඇතත් මේ වන තෙක් කෙසෙල්වත්ත පොලිසියෙන් ප්‍රතිචාරයක් නොමැත. ඉන් අනතුරුව ණය අයකර ගැනීම සඳහා මොරටුව පොලිස් ස්ථානය වෙත ද ලිපි මඟින් දැනුම් දී නැවත සිහි කැඳවීම් ලිපි යොමු කළ ද මෙ වන තෙක් ප්‍රතිචාරයක් නොමැත. • පී.වී.ගුණවර්ධන - රු.162,215.00ක ණය ශේෂ අය කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා අදාල තොරතුරු 2015.12.23 නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර මේ වන විට මෙම නිලධාරියාට විරුද්ධව කොළඹ මහාධිකරණයෙහි නඩුවක් ක්‍රියාත්මක වේ. 2024.01.08 දින සාක්ෂි කැඳවා ඇත. • ජී.ඒ.සී.ගමආරච්චි - රු.111,832.00ක ණය මුදල ඇපකරුගෙන් අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. **සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ** • එන්.ජී.ජේ.සී නාරංගස්පිටිය - රු.20,590. 00ක මුදල අය කර ගෙන ඇත. • එච්.එස්.සී.පුෂ්ප කුමාර - රු.121,392.00ක ණය ශේෂය අය කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා අදාල තොරතුරු 2017.10.30 නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර පුර්ව නීති සාකච්ඡාවක් 2023.11.16 දින නීතිපති දෙපාර්තමේන්තුවේ පවත්වා ඇත. ඉදිරියේ දී මෙම නඩුව කැඳවීමට නියමිතය. • එච්.ඒ.ඒ. චාමර - රු. 117,003. 00ක ණය ශේෂය අය කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා අදාල තොරතුරු 2017.10.30 නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

දෙවැනි කොටස : 64.00	
පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කිරීමට කටයුතු සිදු කරමින් පවති. එය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන අතර ඉදිරියේ දී එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිලිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ</u>

<u>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.</u>

සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	පසුගිය වර්ෂයේ දී කාර්ය සාධන ගිවිසුම් අත්සන් කරන ලෙස සියළුම අංශ වෙත උපදෙස් ලබා දී තිබුණ ද එය විධිමත්ව සිදු නොවුන අතර, ඉදිරියේ දී එම කටයුතු විධිමත්ව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	අමාත්‍යාංශයේ 2021 මුදල් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.
2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	2021 කාර්ය සාධන වාර්තාව සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂිත නීති සංශෝධන ගණන, සමථ මණ්ඩල මඟින් ආරවුල් නිරවුල් කිරීමේ ප්‍රතිශතය, අධිකරණ නිලධාරීන් සඳහා පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාව, විත්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ අවසන් කරනු ලැබූ පැමිණිලි සංඛ්‍යාව, අධිකරණ නොවන නිලධාරීන් සඳහා පැවැත්වීමට අපේක්ෂිත වැඩසටහන් සංඛ්‍යාව, පුහුණු කිරීමට අපේක්ෂිත අධිකරණ නොවන නිලධාරීන් සංඛ්‍යාව, නීති ආධාර සේවය සැපයීමට අපේක්ෂිත පුද්ගලයින් ගණන ලෙස ඉතා පැහැදිලිව මිනුම් කළ හැකි දර්ශක හඳුනාගෙන ඇත.
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක නොතිබුණි.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලද නියෝග හෝ නිර්දේශ නොතිබුණු අතර 2021 මුදල් වර්ෂය සඳහා මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතියෙහි දෙවැනි කොටසෙහි අංක 08 කරුණ යටතේ එවැනි නියෝගයක් හෝ නිර්දේශයක් නිකුත් කර නොතිබුණු බව පැහැදිලිව දක්වා ඇත.

ආයතනයේ නම හා ශීර්ෂය : බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශය - 418
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
<u>පළමු කොටස : 81.00</u>	
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	2021 වර්ෂයට අදාළව විගණන විමසුම් 14ක් ලැබී ඇති අතර ඉන් 13ක් මසක් ඇතුලත පිළිතුරු සපයා ඇති අතර 01ක් පමණක් මාස 02ක් ඇතුලත පිලිතුරු සපයා ඇත.
මු.රෙ.134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම නිසා අභ්‍යන්තර විගණන ඒකකයක් එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක නොවීම මත අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනකාධිපති වෙත ඉදිරිපත් කිරීමට හා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය.
විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇති අතර එහි වත්කම් මේ වන විට වෙනත් ආයතන වෙත පවරා ඇති අතර ඉතිරි වත්කම් අධිකරණ අමාත්‍යාංශය වෙත පවරා ඇත. ඒ අනුව ඉදිරියේ දී භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌනතා පිළිබඳව වන නිර්දේශ නියමිත කාල වකවානුව තුළ සිදු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.
සියලුම වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත	සියලුම වාහනවල අයිතිය මේ වන විට අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත පවරා ගෙන ඇත.
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	ඉදිරියේ දී සියලු වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කරනු ලැබේ.
වාහනයක් ගර්හිත වී මාස 8කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	පැවති බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රවාහන කටයුතු මෙම අමාත්‍යාංශය වෙත පැවරීමේ දී ප්‍රවාහන විෂයට අදාළ වාහන මෙම අමාත්‍යාංශයට පවරා ගන්නා ලදී. එම අවස්ථාවේ දි ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණ වාහනයක් තිබෙන බවට වාර්තා වී නොමැත.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මෙ වන විට මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	• ඒ.එන්.ඒ.සමරනායක - රු.110,854.68ක හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා නිලධාරියාට විරුද්ධව කොළඹ දිසා අධිකරණයෙහි නඩුවක් ක්‍රියාත්මක වේ. 2019.12.30 දින ඇස්කිසි ක්‍රියාත්මක කිරීම සඳහා නිවැරදි ලිපිනය නීතිපති දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. • ජේ.එම්.එස්.කුමාරසිරි - රු.118,465.00ක හිඟ ණය ශේෂ අය කර ගැනීම සඳහා නිලධාරියාට විරුද්ධව ගංගොඩ දිසා අධිකරණයෙහි නඩුවක් ක්‍රියාත්මක වේ. 2023.08.05 දින ඔහු පදිංචි පලාතේ ග්‍රාම නිලධාරී මඟින් සිතාසි නිකුත් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. දැනට නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව විසින්ද වාර්තාවක් කැඳවා ඇත.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	රාජකාරි බහුලත්වය මත නියමිත කාල වකවානුව තුළ අතුරු අග්‍රීම නිරවුල් කිරීමට නොහැකි වී ඇත.

දෙවැනි කොටස : 77.00	
සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම්ගත පුහුණු අවස්ථා ලබා දීමට නොහැකි වී ඇති අතර ඉදිරියේ දී සියළුම නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරනු ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ	රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 මුදල් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කළ මතයක්

අභිතකර මට්ටමේ විය.	ප්‍රකාශ කර ඇත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ වන ඒ.එන්.ඒ.සමරනායකගේ රු110,854.68ක මුදල හා ජේ.එම්.එස්.කුමාරසිරි රු.118,465.00ක මුදල අය කර ගැනීම සඳහා ඉහත පරිදි නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

ආයතනයේ නම හා ශීර්ෂය : අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව - 228
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
<u>පළමු කොටස : 81.00</u>	
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාර වැටුප් සකස් කිරීමේ පරිගණක මුදුකාංගයට අදාල පළමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි	2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාර වැටුප් සකස් කිරීමේ පරිගණක මුදුකාංගයට අදාල පළමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කරන ලෙසට මහාධිකරණ වෙත දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම 2015.09.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් නිකුත් කළ MNPEA/AAG/15 දරණ මාර්ගෝපදේශයේ උපදෙස් අනුව සකස් කර ඇත. 2022,2023, සහ 2024 ක්‍රියාකාරී සැලසුම් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 20/2020 අනුව සකස් කර ඇත.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ඉදිරියේ දී ප්‍රමාදයකින් තොරව පිළිතුරු යැවීමට කටයුතු කරනු ලැබේ.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	ඉදිරියේ දී සියලු වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතිණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ගඅනුව කටයුතු කර ඇත. I. එක් එක් අධිකරණ කලාපයන් තුළ ගණකාධිකාරී, මහාධිකරණ රෙජිස්ට්‍රාර් හා කලාපයේ වෙනත් අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයෙක් යන නිළධාරීන්ගෙන් සමන්විත කමිටු පත් කර එම කමිටුවේ යෝජනා මත හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීමට පියවර ගැනීම. II. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් මරණ පාරිතෝෂික හා විශ්‍රාම වැටුප් පාරිතෝෂික සැකසී නොමැති බැවින් මරණ පාරිතෝෂිකය නිදහස් කළ වහාම ණය ශේෂය නිරවුල් කරගැනීමට කටයුතු කිරීම හා හිමිකරුවකු නොමැති වීම නිසා ඉල්ලුම් කර නොමැති මරණ පාරිතෝෂිකයන්ගෙන් හිඟ ණය ශේෂය පමණක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා ලබාගැනීමට කටයුතු කරන ලෙස අධිකරණ දැනුවත් කිරීම. III. ණයකරුවන්ගේ ස්ථිර පදිංචිය තහවුරු කර ගැනීමට නොහැකි වූ විට ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිළධාරී මඟින් පදිංචිය තහවුරු කර ණය ශේෂයන් පියවන ලෙස ලිපි මඟින් දැනුම් දීම හරහා ණය මුදල නිරවුල් කර ගැනීම. IV. ණයකරුගෙන් ණය මුදල අයකර ගැනීමට නොහැකි අවස්ථාවලදී ඇපකරුවන් මඟින් ණය මුදල පියවා ගැනීමට කටයුතු කිරීම. V. නෛතිකමය ක්‍රියාමාර්ග ගැනීම මඟින් ණය ශේෂය නිරවුල් කිරීමට පියවර ගැනීම. VI. දීර්ඝ කාලයක සිට හිඟව පවතින දේපල ණය ශේෂයන්වල ඇප ඔප්පු පිළිබඳ තොරතුරු අධිකරණ මඟින් ලබා ගෙන අදාළ ඇප සුරැකුම් මඟින් ණය ශේෂ නිරවුල් කිරීම සඳහා කටයුතු කිරීමට නියමිතයි.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පත් ලෙස පවතිනුයේ ඉදිකිරීම්වලට අදාළ කොන්ත්‍රාත්කරුවන්ගේ රැඳවුම් මුදල් හා නඩු කටයුතුවලට අදාල ඇප තැන්පත් වේ. වසර 02කට වඩා අධික කාලයක් ක්‍රියාත්මක වන ඉදිකිරීම්වලට අදාල රැඳවුම් මුදල් අදාල ඉදිකිරීම අවසන් වන තෙක් රඳවා තබා ගත යුතු බැවින් එම තැන්පතු වසර 02 ඉක්මවුවද තැන්පත් ගිණුමේ රඳවා තබා ගත යුතුව ඇත. එමෙන්ම විදේශ සිතාසි වෙනුවෙන් වන තැන්පත් ශේෂ සඳහා අධිකරණ නියෝගයක් ලැබෙන තෙක් රඳවා තබා ගතයුතු වේ. එසේම අධිකරණයන්හි පවතින වසර 02ට වඩා කල් ඉකුත් වූ තැන්පතු නඩු කටයුතුවලට අදාළ ඇප තැන්පත් වන බැවින් නඩු කටයුතු අවසන් වන තෙක් රඳවා තබා ගත යුතු වේ.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ</u>

<u>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.</u>

<u>දෙවැනි කොටස : 69.00</u>	
පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කිරීම, එය ක්‍රියාත්මකවීම පිළිබඳව අධීක්ෂණය සහ ඇගයීම, මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීම, මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කිරීම ආදි කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසිනි. මේ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි	
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50%කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගතව නොතිබුණි.	
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි	
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය.	ආයතනයේ 2021 මුදල් වර්ෂය සඳහා ගිණුම් පිළිබඳ තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව - 234
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
පළමු කොටස : 84.00	
බඩු වට්ටෝරු ලේඛණය යාවත්කාලීන පවත්වා නොතිබුණි	බඩු වට්ටෝරු පොත යාවත්කාලීන කර පවත්වා ගනී.
2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මුදුකාංගයට අදාල පළමු, දෙවන සහ තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.	වැටුප් සකස් කිරීමේ පද්ධතියේ මුරපද තුන් මසකට වරක් වෙනස් කිරීම සිදු කරනු ලබයි.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුලත පිළිතුරු සැපයීම සිදු කරනු ලබයි.
මු.රෙ.134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා ලබා දෙන පිළිතුරුවල පිටපත් විගණකාධිපති වෙත ලබාදීමට කටයුතු කර ඇත.
මු.රෙ.134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	රාජ්‍ය ලාංඡනය සහිත (Board) පුවරු මඟින් ප්‍රදර්ශනය කර ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	මු.රෙ. අනුව අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ අවසන් කර ඇත.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දාහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	ඉන්ධන දහනය වීම පරීක්ෂා කිරීමට කටයුතු කරමි.
වර්ෂයකට වඩා වැඩිකාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	එක් සේවකයෙකුගේ ණය ශේෂයක් පමණක් පවතින අතර එම හිඟ ණය ශේෂය අඩු කර ගැනීමට කටයුතු කරමින් පවතී.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

දෙවැනි කොටස 58.00	
ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛණගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛණ පවත්වා නොතිබුණි.	තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා නිලධාරියෙකු පත් කර ඇති අතර ලැබෙන පැමිණිලි ලේඛණගත කර ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගනු ලැබේ.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනා ගෙන ඇත.
හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ලගා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ලගා කර ගත යුතු ඉලක්ක හඳුනාගෙන ඇත.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන ඇත.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ චක්‍ර ලේඛ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ චක්‍ර ලේඛ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	අවම පැය 12කට නොඅඩු පුහුණුවීම් අවස්ථා සහතික කර ඇත.
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	සමස්ත කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් අත්සන් කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාව වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	සැලසුම කළ පරිදි 50%කට වැඩි මට්ටමට පුහුණු අවස්ථා සලසා දී ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි මුල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව ප්‍රකාශ කර ඇත.
2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්ය සාධක දර්ශක 03ක් හඳුනාගෙන ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : ණය සහනදායී මණ්ඩලීය දෙපාර්තමේන්තුව - 231
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
පළමු කොටස : 91.00	
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	මේ වනවිට රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළවෙනි මුරපදය ගණකාධිකාරී පමණක් භාවිතා කරනු ලැබේ.
2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොපවතින අතර අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබයි.
මු. රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් මේ වන විට සිදු කර ඇත.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිමවූ විගස නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. මේ වන විටත් එය ක්‍රියාත්මක වේ.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබුණි.	2021 වර්ෂයේ දී බඳවා ගත් උපාධිධාරී අභ්‍යාසලාභීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීමේ දී කාර්ය මණ්ඩලය අනුමත සීමාව ඉක්මවා බඳවා ගෙන තිබුණ ද මේ වන විට කාර්ය මණ්ඩලය අනුමත කර ගෙන ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

දෙවැනි කොටස : 73.00	
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ඉදිරියේ දී පත් කිරීමට නියමිතය.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මේ වනවිට සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 90% දක්වා වර්ධනය වී ඇත. 2021 වර්ෂයේ කොවිඩ් වසංගතය හේතුවෙන් පුහුණු අවස්ථා නිසි ලෙස ක්‍රියාත්මක නොවීය.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය වුයේ තත්ත්වාගණනය කළ මතය වේ
මු.රෙ.119 ප්‍රකාරව අය කළ යුතු අධිභාර අයකර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුවේ අයකළ යුතු අධිභාර පවතින බව නිරීක්ෂණය නොවේ.

ආයතනයේ නම හා ශීර්ෂය : රස පරීක්ෂක දෙපාර්තමේන්තුව - 233
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස : 81.00	
මු.රෙ. 134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව වෙත වැඩබලන පදනමින් අභ්‍යන්තර විගණක තනතුර වෙත නිලධාරිනියක් පත්කරන ලද්දේ 2021.11.19 දින වේ. කෙසේ වුවද එම නිලධාරිනිය 2021 වර්ෂයේ දී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගත් අතර මු.රෙ. 134(2) විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන වාර්තා පිළියෙල කිරීමට තරම් ප්‍රමාණවත් කාලයක් නොතිබුණි.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු රට පුරා පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාල ප්‍රමාදයක් සිදු වී ඇත. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල සිදු කරන ලෙස අදාල ආයතනය වෙත උපදෙස් ලබා දී ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	මේ වන විට ලොග් පොත් යාවත්කාලීන කර ඇත.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි	වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමේදී සිදු වී තිබූ ප්‍රමාදයන් හැකිතාක් අවම කර ගනිමින්, කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. පරීක්ෂණ ප්‍රමාද වීමට පොලිස් වාර්තා ලැබීම ප්‍රමාද වීම මෙන්ම, අනතුරු පරීක්ෂණ කමිටුවල වාර්තා ලැබීම ප්‍රමාද වීම බලපා තිබුණි. මේ වන විට අදාල නිලධාරීන්ට අවශ්‍ය

	දැනුම සහ උපදෙස් ලබා දී අනතුරක් සිදු වූ වහාම මු.රෙ. 103,104 අනුව පරීක්ෂණ ආරම්භ කර ඉදිරි කටයුතු කිරීමට පියවර ගෙන ඇත.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දාහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	මේ වන විට ඉන්ධන දහන පරීක්ෂා වාර්ෂිකව සිදු කිරීමට සැලසුම් කර ඇති අතර 2023 වර්ෂය සඳහා මේ වන විට එම පරීක්ෂණ සිදු කර අවසන් කර ඇත
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකරගෙන තිබුණි.	2021 වර්ෂයේ දී වැය විෂය කීපයකට අදාල ප්‍රතිපාදන සීමා ඉක්මවා බැඳීම්වලට එළඹ තිබූ අතර එය මු.රෙ. 94(2) ප්‍රකාරව සිදු කර ඇති බව දන්වමි.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි	මේ වන විට ලබා ගත් අග්‍රිම නියමිත කාල සීමාව තුල පියවිය යුතු බව නිලධාරීන්ට ලිඛිතවම දැනුවත් කර ඇති අතර එම අග්‍රිමයන් නිසි පරිදි පියවීමට කටයුතු කරනු ලැබේ.

දෙවැනි කොටස : 70.00	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2022/2023 වර්ෂ සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් 2022/11/23 දින සකස් කරන ලදි.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50%කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2021 වර්ෂය තුලදී ව්‍යාප්තව ලොව පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රට තුල පැවති සංචරණ සීමා හා අනෙකුත් බාධා හේතුවෙන් දේශීය හා විදේශීය පුහුණුවලට යොමු කිරීම සීමා විය. තවද 2022/2023 වර්ෂ තුලදී අයවැය චක්‍රලේඛ වලින්, දේශීය අරමුදල් වලින් පුහුණු අවස්ථා සැලසීම අවුරා තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ සිට මේ දක්වා නිලධාරීන්ට ප්‍රමාණවත් පරිදි පුහුණු අවශ්‍යතා ලබා දීමට නොහැකි වූ අතර නොමිලේ ලබා ගත හැකි, අදාල පාඨමාලා සඳහා පමණක් නිලධාරීන් යොමු කරන ලදී.
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	මේ වන විට කාර්ය සාධන ගිවිසුම් සකස් කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ (පරිපාලන) නම් කර ඇත
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	ආයතනයේ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ ඇති බව සඳහන් වුවද 2022 මැයි 30 දින නිකුත් කරන ලද විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව අනුව දෙපාර්තමේන්තුව වෙත තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කර ඇත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද නියෝග හෝ නිර්දේශ නොතිබුණු අතර 2021 මුදල් වර්ෂය සඳහා මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතියෙහි එවැනි නියෝගයක් හෝ නිර්දේශයක් නිකුත් කර නොතිබුණු බව පැහැදිලිව දක්වා ඇත.

ආයතනයේ නම හා ශීර්ෂය : නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව - 230
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
පළමු කොටස : 90.00	
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂය සඳහා මෙම දෙපර්තමේන්තුවට කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර නොතිබුණි. වර්තමානයේ දී ලැබෙන සියළුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර 2022 හා 2023 වර්ෂවල දී ඒ අනුව කටයුතු කර ඇත.
2018 08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂය සඳහා මෙම දෙපර්තමේන්තුවට කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර නොතිබුණි. මෙම දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බැවින් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අභ්‍යන්තර විගණනය සිදු කරන අතර වර්තමානයේ දී එම ඒකකය මඟින් නිකුත් කරන අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි.
මු.රෙ. 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	
මු.රෙ. 134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	
2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1කොටසේ 11.1 ඡේදය සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වර්තමානයේ දී මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	වර්තමානයේ දී මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වා දී ඇති නිර්දේශ අදාල කාල වකවානුව තුල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දී ඇති අතර 2022 වර්ෂයේ දී ඒ අනුව කටයුතු කර ඇත.
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	ඉදිරියේ දී කටයුතු කරනු ලබයි.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත	වර්තමානයේ දී සෑම වාහනයකටම අදාළ ලොග් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.

පවත්වා නොතිබුණි.	
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	පසුගිය වර්ෂවල පැවති QR ක්‍රමවේදය නිසා ඉන්ධන සපයා ගැනීම සීමා වීම හේතුවෙන් වාහනවල ඉන්ධන පරීක්ෂාවන් චක්‍රලේඛ ප්‍රකාරවසිදු කර නොමැත. දැනට ඒ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රවාහන භාරනිලධාරී වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	වර්තමානයේ දී බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කරනු ලබයි.

දෙවැනි කොටස: 74.00	
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	වර්තමානයේ තිරසර සංවර්ධන අරමුණුවල අංක 16 යටතේ හඳුනාගන්නා ලද ඉලක්ක අනුව එහි ප්‍රගතිය වාර්තා කිරීමට කටයුතු සලසා ඇත.
හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	
හඳුනාගත් තිරසර අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	
පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට පිළියෙල කර ක්‍රියාත්මක කරනු ලබයි.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිලිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2022 වර්ෂය සඳහා මානව සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50%කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	රජය විසින් කරන ලද ප්‍රතිපාදන සීමා කිරීමට අනුගත වීම හේතුවෙන් හා විදේශ පුහුණු (නීති නිලධරයන්ගේ) සඳහා ප්‍රමුඛත්වය ලබා දීම අනිවාර්ය අවශ්‍යතාවයක් වන බැවින් පුහුණු අවස්ථා සීමා සහිත වූ අතර, ඉදිරියේ දී මානව සම්පත් සංවර්ධන සැලැස්ම සංශෝධනය කර සියලුම කාර්ය මණ්ඩලයට පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරනු ලැබේ.
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	ඒකාබද්ධ සේවයේ කාර්ය මණ්ඩලය සඳහා මේ වන විට රාජකාරි ලැයිස්තු ලබා දී ඇති අතර සමස්ත කාර්ය මණ්ඩලයටම කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සඳහා මේ වන විට ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	2023 වර්ෂය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ</u>

<u>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.</u>

සැලසුම්ගත පුහුණු අවස්ථාව වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	රජය විසින් කරන ලද ප්‍රතිපාදන සීමා කිරීම්වලට අනුගත වීම හේතුවෙන් හා විදේශ පුහුණු (නීති නිලධරයන්ගේ) සඳහා ප්‍රමුඛතාවය ලබා දීම අනිවාර්ය අවශ්‍යතාවයක් වන බැවින් පුහුණු අවශ්‍යතා සීමා සහිත වූ අතර සංවර්ධන සැලැස්ම සංශෝධනය කර සියලුම අවස්ථා ලබා දීමට කටයුතු කාර්ය මණ්ඩලයට පුහුණු කරනු ලැබේ.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

ආයතනයේ නම හා ශීර්ෂය : නීතිපති දෙපාර්තමේන්තුව - 229
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
<u>පළමු කොටස: 67.00</u>	
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාල වසා තැබීම නිසා විගනන විමසුම් සඳහා පිළිතුරු යැවීම ප්‍රමාද විය. විගණන විමසුම් පිලිතුරු යැවීමේ ප්‍රමාදයන් මඟ හරවා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුලත රු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂයේ රටෙහි ඇති වූ කෝවිඩ් වසංගත තත්ත්වය මත පිට පළාත් කාර්යාලයන්හි භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාලය තුල සිදු කල නොහැකි වූ අතර වරින් වර කාර්යාල වසා තැබීම නිසා භාණ්ඩ සමීක්ෂණයෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමද ප්‍රමාද වීම මත භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. මේ වන විට 2023 වර්ෂය දක්වා භාණ්ඩ සමීක්ෂණ හා කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම අවසන් කර සමීක්ෂණ වාර්තාවන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. මුදල් රෙගුලාසි ප්‍රකාරව 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිලිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	2021 වර්ෂයේ සිට රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු. රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර ඇත. මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතියෙහිද එය නිවැරදි ලෙස සටහන් කර ඇත.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවන් කර නොතිබුණි.	2021 වර්ෂයේ වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් නිම කර ඇති අතර අඛණ්ඩව සියළු වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කරනු ලැබේ. මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතියෙහිද එය නිවැරදි ලෙස සටහන් කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂයේ බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනයට ඉදිරිපත් කර ඇති අතර මූල්‍ය පාලනය සහ කාර්ය සාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතියෙහිද එය නිවැරදි ලෙස සටහන් කර ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ</u>

<u>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.</u>

සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි.	2022 වර්ෂයේදී අක්‍රිය බැංකු ගිණුම නිරවුල් කර වසා දැමීමට කටයුතු කරන ලදි.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයට සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිවූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	2021 වර්ෂය සඳහා අත්‍යවශ්‍ය සේවාවන් සපයා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර තිබුණ ද, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීමත්, භාණ්ඩ මිල ගණන් ඉහළ යාමත් සිදුවූ අතර රාජකාරි කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සේවාවන් සපයා ගැනීම වෙනුවෙන් බැරකම්වලට එළඹීමට සිදු විය. ඉදිරියේ දී ප්‍රමාණවත් ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමටත්, පවතින ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩිකාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2021 වර්ෂයේ අවසානයට සේවය හැරගිය නිලධාරින්ගෙන් අය විය යුතුව තිබූ රු.1,636,157 ක ණය ශේෂයෙන් රු.1,022,635.00 ක මුදලක් මේ වන විට අයකර ගෙන ඇත. අනෙකුත් ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ EST/6/04/LOL/1030 ලිපිය හා රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ SA/SDA/1/1/21 ලිපිය අනුව අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	නිලධාරීන් ලබා ගන්නා තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 07 ක් ඇතුලත නිරවුල් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති අතර ඒ අනුව අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.
මු.රෙ.371හි වන සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	ඉදිරියේ දී මු.රෙ. 371 හි වන සීමාව අනුව පමණක් තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දීමට කටයුතු කරනු ලැබේ.

<u>දෙවැනි කොටස: 60.00</u>	
ආයතයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාවන් සලසා දි නොතිබුණි	මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා ආයතයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවියේ කිසිදු ඉඩ ප්‍රස්තාවක් නොමැති අතර දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව ලැබෙන පෙත්සම් සලකා බැලීම සඳහා නීති නිලධාරීන්ගෙන් හා අනෙකුත් කාර්ය මණ්ඩලයෙන් සමන්විත මහජන පෙත්සම් අංශය නමින් වෙනම ඒකකයක් දෙපාර්තමේන්තුව සතුව පවති.
හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ලභා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	තිරසර සංවර්ධන සභාව මගින් නිශ්චය කර ඇති ආකාරයට, නීතිපති දෙපාර්තමේන්තුව සඳහා 16 වැනි තිරසර සංවර්ධන අරමුණ වන,සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන යන තිරසර අරමුණ හඳුනාගෙන ඇත.උක්ත තිරසර අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ඉලක්කය නිශ්චය කර ඇත.“සියළුමදෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා අවශ්‍ය දර්ශක සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළයෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුවේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කර ඇති අතර එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කටයුතු කරනු ලැබේ.
ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ චක්‍ර ලේඛ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබුණි	අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධි විධාන අනුව 2022 හා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පුහුණු අවස්ථා ලබා දීම සඳහා වූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත. කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා සහතික වන පරිදි අවශ්‍ය සංශෝධනයන් සිදු කරනු ලැබේ.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12ක නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත් කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කෙරෙමින් පවතී.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට හා ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කිරීමට කටයුතු කරනු ලැබේ.
සැලසුම්ගත පුහුණු අවස්ථාව වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ රට තුළ පැවති කෝවිඩ් තත්ත්වය මත කාර්යාල වරින්වර වසා තිබූ බැවින් සැලසුම් කල පුහුණු අවස්ථා ක්‍රියාත්මක කල නොහැකි වූ අතර 2023 වර්ෂයේදී නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය.	2021 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවට අනුව විගණකාධිපති සඳහන් කර ඇත්තේ 2021 දෙසැම්බර් 31 දිනට නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළබිඹු කරන බව ඔහු දරන්නා වූ මතය වන බවයි. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබේ.
සියලුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව - 235
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
පළමු කොටස:91.00	
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව තුළ වැටුප් සැකසීම සඳහා 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයක් භාවිතා කිරීම සිදු නොවේ.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලමු, දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට සකස් කර ඉදිරිපත් කර ඇත.
වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	වාර්ෂික ප්‍රසම්පාදනසැලැස්ම නියමිත දිනට සකස් කර ඉදිරිපත් කර ඇත.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවන් කර නොතිබුණි.	ඉදිරියේ දී 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවන් සිදු කරන ලෙසට නීති කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරමි.

දෙවැනි කොටස: 52.00	
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කිරීම උක්ත වර්ෂයේදී සිදු නොවූයේ කොවිඩ් ව්‍යසනය හේතුවෙන් පිරිස් ඒකරාශී වීම සීමා කිරීමෙන් පුහුණු අවස්ථා අඩු කිරීමත් පැවැත්වීමට නියමිත පුහුණු වැඩසටහන් අපගේ පුහුණු අවශ්‍යතා සඳහා නොගැලපීමත් නිසාවෙනි.තවද රාජ්‍ය වියදම් සීමා කිරීම මත පුහුණුවීම් සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අක් මුදල් ලබා නොදීමත් මේ සඳහා හේතු විය.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2021.05.11 දිනැති විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවට අනුව ආයතනයේ ගිණුම් පිළිබඳ තත්ත්වාගණන කළ මතයක් ප්‍රකාශ කර ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : - බන්ධනාගාර දෙපාර්තමේන්තුව 232
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කම්ටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
පළමු කොටස:70.00	
ලැබෙන චෙක්පත් සහ මුදල් ඇණුවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අදාල ලේඛන නිවැරදිව යාවත්කාලින කිරීමට උපදෙස් ලබා දී ඇත.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	මේ වන විට හානි පාඩු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	මේ වන විට අදාල චක්‍රලේඛ පරිදි කටයුතු කරගෙන යනු ලබයි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේදි අදාල කරුණු සම්බන්ධ ආයතන වෙතින් තොරතුරු ගෙන්වාගෙන පරීක්ෂාකර පිළිතුරු සැපයිය යුතු බැවින් ලබාදෙන කාලය ප්‍රමාණවත් නොවීම නිසා අතුරු පිළිතුරක් යැවීමට කටයුතු කරන අතර, හැකි සෑමවිටම කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	නියමිත කාලය තුල පිළිතුරු ලබාදීමට කටයුතු කරන අතර, නොහැකි අවස්ථාවන්හිදි කාලය ඉල්ලා අතුරු පිළිතුරක් යැවීමට කටයුතු කරනු ලබයි.
2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුලත රු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණට අදාල වාර්තා නියමිත දිනට සැපයිමට හැකිවන පරිදි මේ වන විට අදාල කටයුතු ආරම්භ කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	
සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදනය කරනු ලැබූ වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ ඇති අතර, මෙම අමාත්‍යාංශය මඟින් ලබා දී ඇති වාහන අතුරින් කොටසක් විධීමත් පරිදි පවරා දී ඇති අතර, ඇතැම් වාහන ලේඛනවල අඩුපාඩු හේතුවෙන් පවරා දීමට නොහැකිව ඇත. එම වාහන පවරා දීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට අදාල මාසික සාරංශ විගණකාධිපති වෙත ලබා දීමට ඉදිරිපත් කරනු ලබයි.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	මෙම වසරේ දී අදාල කටයුතු ඉටු කිරීමට සැලසුම් කර ඇත.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.	මේ වන විට නිසි පරිදි කටයුතු කරනු ලබයි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	මෙම කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා කමිටු පත්කර ඇති අතර ලබාදෙන නිර්දේශ අනුව අදාල හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.
පොදු තැන්පත් ගිණුම් කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ ඉකුත් තැන්පතු සම්බන්ධව මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කරමින් පවතී.
මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	මෙම කටයුතු නිවැරදි කර ගැනිම සඳහා නිලධාරින් දැනුවත් කරමින් කටයුතු කරනු ලබයි.
රැස්කර තිබූ ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවාගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි.	නිසි පරිදි ගිණුම්ගත කිරීමේ කටයුතු කරමින් පවතී.

දෙවැනි කොටස : 81.00	
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	2021 වර්ෂය සඳහා සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගත වීම නිසි ආකාරව සිදුවී නොතිබුණු අතර, 2022 වර්ෂය සඳහා එම අඩුපාඩු නිවැරදි කරගෙන 2022 වර්ෂය සඳහා සමස්ථ මාණ්ඩලික නිලධාරි කාර්ය මණ්ඩය ද ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත වී ඇත.
සැලසුම්ලත් පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේදී රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණු කටයුතු සඳහා නිලධාරීන් ගෙන්වීමට හා රැස්වීමට ඇති වූ අපහසුතාවය නිසාවෙන් අත්කර ගතයුතු ප්‍රගති මට්ටම 50% ක් පැවති අතර,2022 වර්ෂයට සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රගතිය 99% ක් අත් ඇති අතර, 2023 වර්ෂයට සැලසුම්ලත පුහුණු අවස්ථා ප්‍රගතිය 100% ක් වේ.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු අත්තිකාරම් ගිණුම් සඳහා පමණක් ව්‍යාවනය කළ මතයක් ලබා දී තිබුණ ද ඉන් පසුව විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව නිවැරදි කිරීම් සිදු කර ඇති අතර වැය ශීර්ෂ 232 සඳහා 2021 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ ඇත.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	2021 වර්ෂය තුල මෙම නිර්දේශ බොහෝමයක් ක්‍රියාත්මක කර ඇති අතර ඉතිරි කරුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවති.

උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරින් නිසි පරිදි ස්ථාන මාර කර යැවීමට කටයුතු කර නොතිබුණි.	2022 හා 2023 වර්ෂ පිළිවෙලින් ස්ථාන මාරු කමිටුව මඟින් නිලධාරින් 503 සහ 669 දෙනෙකු ස්ථාන මාරු සිදුකිරීමට යෝජනා කර ඇති අතර, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ගේ සහ මාණ්ඩලික නොවන නිලධාරින්ගේ ස්ථාන මාරු පටිපාටින් කෙටුම්පත් කිරීම ආරම්භ කර ඇත.

ආයතනයේ නම හා ශීර්ෂය : - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව 326
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
<u>පළමු කොටස:80.00</u>	
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 267/2018 චක්‍රලේඛයේ 08 ඡේදයේ 8.1 අනු ඡේදයේ සඳහන් පරිදි දෙපාර්තමේන්තුවේ සිගාස් වැඩසටහන අනුව 2012 වර්ෂයේ සිට මේ දක්වා ස්ථාවර වත්කම් යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකර ඇත. ප්‍රධාන කාර්යාලයේ ඇති ස්ථාවර වත්කම් මේ වන විට ක්ෂතකරණය කර ඇත.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	හානි පිළිබඳ ලේඛණයක් පවත්වා ගෙන යන අතර, එය යාවත්කාලීන කර ඇත.
2004.05.11දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	මේ වන විට අදාල චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු සිදුකර ඇත.
2004.05.11.දිනැති අංක 171/2004දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු දෙවන සහ තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි	මේ වන විට අදාල චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු සිදුකර ඇත.
මු.රෙ.134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂය සඳහා මෙම දෙපර්තමේන්තුවට කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර නොතිබුණි. මෙම දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති බැවින් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අභ්‍යන්තර විගණනය සිදු කරන

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

	අතර වර්තමානයේ දී එම ඒකකය මඟින් නිකුත් කරන අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබයි.
2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුලත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සියල්ල මේ වන විට අවසන් කර විගණන අධිකාරි වෙත අදාල වාර්තා සියල්ල භාරදී ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ එක් සංචිත වාහනයක රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. අනෙක් වාහන 02හි රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවන් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ සංචිත වාහන 02ක ඉන්ධන පරීක්ෂාවන් සිදු කර ඇති අතර එක් වාහනයක් අළුත්වැඩියාව සඳහා යොමු කර තිබූ බැවින් එම රථයේ ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි විය. එම රථය අළුත්වැඩියාවෙන් ලද පසු ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	මේ වන විට සියළුම නිරවුල් කිරීමේ කටයුතු අවසන් කර ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වැඩ තහනමකට ලක්ව ඇති එක් නිලධාරියෙකු සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයේ අවසන් වාර්තාව මේ වන විටත් ලැබී නොමැත. එබැවින් මීට අදාල ඉදිරි කටයුතු සිදුකිරීමට නොහැකි වී ඇත. එම පරීක්ෂණය අවසන් වූ වහාම අයවිය යුතු හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව කටයුතු සිදුකරමින් පවති.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බදවා ගෙන තිබුණි.	මේ වන විට දෙපාර්තමේන්තුවේ අනුමත සීමාව අනුව කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්ත්වය
දෙවැනි කොටස:31.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍යය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මහජනතාවට අවශ්‍ය තොරතුරු දැන ගැනීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර ඇති අතර එය යාවත්කාලීනව පවති. තවද මහජනතාවට ප්‍රතිචාර දැක්වීමට එහි අවස්ථාව ලබාදී ඇත.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	
පුරවැසි සේවා ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි/ සේවා ප්‍රඥප්තිය මේ වන විට සකස් කර ඇති අතර ප්‍රාදේශීය කාර්යාල වෙත ප්‍රදර්ශනය කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත.
ආයතනයේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පුරවැසි/ සේවා ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳව අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇත. අදාල ප්‍රඥප්තිය අනුව ප්‍රාදේශීය කාර්යාලයේ කටයුතු සිදු වෙන්නේදැයි පළාත් භාර ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී විසින් සෘජුව අධීක්ෂණය කරන අතර සේවාලාභීන්ට පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව ගැටලු ඇත්නම් පළාත් භාර ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී හා ප්‍රධාන කාර්යාලය වෙත දැන්වීමට දුරකතන අංක, ඊමේල් හා ෆැක්ස් අංක ප්‍රදර්ශනය කර ඇත.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	02/2018 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2023 වර්ෂය මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයකට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම්ගත පුහුණු අවස්ථා ලබා දීමට නොහැකි වී ඇති අතර ඉදිරියේ දී සියළුම නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරනු ඇත.
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා 2023 වර්ෂයේදී කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව ඇත.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරියෙකු පත් කර ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ</u>

<u>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය.</u>

සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේ රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය අංශ මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි නිලධාරීන් ඒකරාශී කර පුහුණු වැඩසටහන් පැවැත්වීම සීමා කර තිබූ බැවින් අපේක්ෂිත පරිදි පුහුණු වැඩ සටහන් පැවැත්වීමට නොහැකි විය.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල්චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකල යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක 03ක් හඳුනාගෙන නොතිබුණි.	මේ වන විට කාර්ය සාධක දර්ශක 03ක් හඳුනාගෙන ඇත.
විගණකාධිපති චාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට විගණකාධිපති චාර්තාවේ නිර්දේශ බොහොමක් ක්‍රියාත්මක කර ඇත.
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට පහත සඳහන් කර ඇති ආකාරයට රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කරමින් පවතී. 1. විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ණ අධීක්ෂණය යටතේ පමණක් විගණන විමසුම් සඳහා පිළිතුරු යොමු කරනු ලැබේ. 2. ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත නිලධාරීන් සඳහා දැනට පවතින බඳවා ගැනීමේ හා උසස්වීම් පටිපාටිවල ඇති ගැටලු හඳුනාගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පටිපාටි සංශෝධනය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. 3. ආඥාලාභීන් සඳහා විශෝධන මධ්‍යස්ථාන පැවතීමේ අවශ්‍යතාවය පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළ අතර ඒ අනුව විශෝධන මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා සුදුසු ස්ථාන පිළිබඳව සොයා බලන ලදී. මේ වන විට කැකිරාව ප්‍රදේශයේ වසා දමන ලද පාසලක් පිහිටි ඉඩමක් හඳුනාගෙන ඇති අතර එම ඉඩම මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා කැකිරාව ප්‍රාදේශීය ලේකම් විසින් පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය සඳහා යොමු කර ඇත. 4. දෙපාර්තමේන්තු කටයුතු තව දුරටත් ශක්තිමත් කර ගැනීම සඳහා උපදේශන මණ්ඩලයක් පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. 5. ප්‍රජා විශෝධන ක්‍රියාවලිය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් විවිධ වැඩසටහන් සිදු කර ඇති අතර 2022 වර්ෂයේදී, ❖රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම් (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) -216

	5. ප්‍රජා විශෝධන ක්‍රියාවලිය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් විවිධ වැඩසටහන් සිදු කර ඇති අතර 2022 වර්ෂයේදී, ❖රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) -216 ❖අධිකරණ නිලධාරීන් හා නීතිඥවරු දැනුවත් කිරීම - 41 ❖ප්‍රජා දැනුවත් කිරීම (ග්‍රා/නි වසම් ආවරණය පරිදි) - 835 වැඩසටහන් සිදු කර ඇත. ඊට අමතරව 2023 වර්ෂයේදී ❖රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස) - 99 ❖අධිකරණ නිලධාරීන් හා නීතිඥවරු දැනුවත් කිරීම - 48 ❖පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම - 32 ❖ප්‍රජා දැනුවත් කිරීම් (ග්‍රා/නි වසම් ආවරණය පරිදි) - 973 වැඩසටහන් සිදු කර ඇත. 06. එක් එක් අධිකරණය මඟින් එකම වරද සඳහා ලබා දෙන ප්‍රජා විශෝධන නියෝග කාල සීමාවන් වෙනස් වීම පිළිබඳව ගරු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු බුවනෙක අලුවිහාරේ මැතිතුමාගේ සභාපතිත්වයෙන් යුතු දඩුවම් ලබාදීමට ප්‍රතිපත්ති සම්බන්ධ කමිටුව (SENTENCING POLICY COMMITTEE) වෙත ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව කරුණු ඉදිරිපත් කර ඇත.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධව දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට යටත්ව සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් හැකි සෑම අවස්ථාවකදීම වෙනත් සේවා ස්ථාන වෙත මාරු කිරීමට කටයුතු කර ඇත.

.....

ලේකම්

අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

එම්.එන්. රණසිංහ
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.